


## චන්ද්‍රිකා දත්ත මත පදනම් වූ


# ටූනා මත්ස්‍යය බිම් පුරෝකතන සේවාව

# ஆழ் கடல் மீன்பிடித் தளங்களுக்கான எதிர்வு கூறல்

---

ජාතික ජලජ සම්පත් පයෙර්ෂණ හා සංවධර්න නියෝජිතායතනය

கடல்சார் கடல் அறிவியல் தேசிய நிறுவனம் தேசிய நீர்வள
ஆராய்ச்சி அபிவிருத்தி முகாமை




Service credits: "Generated using E.U. Copernicus Marine Service Information. GMI data are produced by Remote Sensing Systems and sponsored by NASA Earth Science funding

බහුදින යාත්‍රා සඳහා මසුන් ගැවසෙන ප්‍රදේශ පිළිබඳ පුරෝකථනය

## ஆழ் கடல் மீன்பிடித் தளங்களுக்கான எதிர்வு கூறல்

නිකුත්කල දිනය பிரசுரிக்கப்பட்ட திகதி :

**2022-12-09**

| දේශාංශ நெட்டாங்கு | | | අක්ෂාංශ அகலாங்கு | | | ගැඹුර ஆழம் |
|---|---|---|---|---|---|---|
| අංශක பாகை | මිනිත්තු கலை | | අංශක பாகை | මිනිත්තු கலை | | බඹ பாகம் |
| 81 | 2 | E | 10 | 13 | N | 29 |
| 83 | 1 | E | 10 | 59 | N | 21 |
| 84 | 18 | E | 11 | 7 | N | 26 |
| 84 | 11 | E | 12 | 38 | N | 31 |
| 89 | 40 | E | 17 | 49 | N | 45 |
| 76 | 48 | E | -5 | 31 | S | 24 |
| 77 | 42 | E | 0 | 15 | S | 48 |
| 80 | 27 | E | 0 | 18 | N | 52 |
| 79 | 2 | E | -1 | 32 | S | 36 |
| 79 | 18 | E | -3 | 44 | S | 36 |
| 81 | 39 | E | -4 | 18 | S | 40 |
| 68 | 39 | E | 0 | 17 | N | 43 |
| 67 | 57 | E | 0 | 55 | S | 38 |
| 69 | 5 | E | 0 | 48 | S | 40 |
| 83 | 42 | E | 6 | 39 | N | 46 |
| 68 | 5 | E | 4 | 41 | N | 36 |
| 68 | 18 | E | 3 | 46 | N | 36 |
| 61 | 41 | E | 9 | 34 | N | 36 |
| 77 | 27 | E | 4 | 15 | N | 27 |
| 80 | 17 | E | 0 | 30 | N | 51 |
| 64 | 25 | E | 6 | 18 | N | 34 |
| 60 | 23 | E | 4 | 40 | N | 19 |
| 65 | 55 | E | 1 | 55 | N | 34 |
| 66 | 54 | E | 1 | 40 | N | 32 |
| 66 | 39 | E | 3 | 4 | N | 33 |
| 67 | 25 | E | 3 | 0 | N | 33 |

**බහු දින යාත්‍රා සඳහා කාලගුණ අනාවැකිය**
**උතුරු අක්ෂාංශ 20 ත් දකුණු අක්ෂාංශ 10 ත් සහ නැගෙනහිර දේශාංශ 60 ත් 100 ත් අතර මුහුදු ප්‍රදේශය සඳහා**
**(2022 දෙසැම්බර් මස 09 දින පෙ.ව. 07.00 ට, ඉදිරි පැය 24 සඳහා නිකුත් කරන ලදි.)**

දිවයින වටා වන මුහුදු ප්‍රදේශ

**නිරිත දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ (ත්‍රිකුණාමලය සිට කි.මී. 240ක් පමණ ඊසාන දෙසින්) ස්ථාපිත වී පවතින "මැන්ඩවුස්" චණ්ඩ සුළි කුණාටුව ඊයේ දින ප.ව. 11.30 වන විට අක්ෂාංශ 10.6N සහ දේශාංශ 82.3E ආසන්නයේ ස්ථානගතව පැවතුනි. මෙම පද්ධතිය බටහිරට බරව වයඹ දෙසට ගමන් කර දෙසැම්බර් 09 රාත්‍රී කාලය වන විට නිරිත දිග බෙංගාල බොක්ක හරහා උතුරු තමිල්නාඩු, පුදුචේරි සහ දකුණු ආන්ද්‍ර ප්‍රදේශ් වෙරළ තීරය හරහා ගමන් කිරීමට බොහෝ දුරට ඉඩ ඇත.**

එම පද්ධතියේ බලපෑමෙන් දෙසැම්බර් 09 දින දිවයිනට උතුරු සහ නැගෙනහිර දෙසින් වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශ වල විටින් විට ඉතා තද සුළං සමග තද වැසි ඇති විය හැකි අතර එම මුහුදු ප්‍රදේශ ඉතා රළු සහ විටින් විට දළ රළු විය හැක.

කන්කසන්තුරය සිට ත්‍රිකුණාමලය සහ මඩකලපුව හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල මුහුදු රළ උස (මීටර්. 2.5 – 3.5 ක් පමණ) ඉහළ යාමේ හැකියාවක් ද පවතී.

**මන්නාරම සිට කන්කසන්තුරය, ත්‍රිකුණාමලය සහ මඩකලපුව හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශ, නිරිතදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශ (07N - 15N, 80E – 86E) සහ දකුණු මුහුදු ප්‍රදේශවලට (02N - 06N, 78E – 86E) නැවත දැනුම්දෙන තෙක් යාත්‍රා නොකරන ලෙස ධීවර සහ නාවික ප්‍රජාවන්ට දැනුම්දෙනු ලැබේ.**

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිළිබඳ සිය අවධානය යොමු කරන ලෙස ධීවර හා නාවික ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.**

**වැසි තත්ත්වය:**

මන්නාරම සිට කන්කසන්තුරය හරහා ත්‍රිකුණාමලය දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. ගාල්ල සිට මාතර හරහා හම්බන්තොට දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි ඇතිවේ.

**සුළඟ:**
දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං වයඹ සිට නිරිත දක්වා වන දිශා වලින් හමා එයි. මන්නාරම සිට කන්කසන්තුරය සහ ත්‍රිකුණාමලය හරහා මඩකලපුව දක්වා සහ ගාල්ල සිට හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශ වල සුළඟේ වේගය පැ.කි.මී. (40-50) පමණ වන අතර විටින් විට පැ.කි.මී. (65-75) පමණ දක්වා වැඩි විය හැක. දිවයින වටා වන අනෙකුත් මුහුදු ප්‍රදේශ වල සුළඟේ වේගය පැ.කි.මී. (30-40) පමණ වන අතර විටින් විට පැ.කි.මී. (50-60) පමණ දක්වා වැඩි විය හැක.
**මුහුදේ ස්වභාවය:**

මන්නාරම සිට කන්කසන්තුරය සහ ත්‍රිකුණාමලය හරහා මඩකලපුව දක්වා වන මුහුදු ප්‍රදේශ ඉතා රළු සහ විටින් විට දළ රළු විය හැක . ගාල්ල සිට හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශ විටින් විට ඉතා රළු විය හැක. දිවයින වටා වන අනෙකුත් මුහුදු ප්‍රදේශ විටින් විට රළු වේ.

බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය

**කාලගුණික තත්ත්වය:**

| | |
|---|---|
| 06N-15N, 80E-88E | : නිරන්තර වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |
| සෙසු මුහුදු ප්‍රදේශ | : බොහෝ ස්ථානවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |

**සුළං තත්ත්වය:**

| | |
|---|---|
| 06N-16N, 80E-88E | : වාමාවර්තව භ්‍රමණය වේ / පැ.කි.මී. (60-70); විටින් විට පැ.කි.මී. (80-90) දක්වා. |
| 00-06N, 80E-92E | : බටහිර සිට නිරිත දක්වා දිශාවලින් / පැ.කි.මී. (30-40); විටින් විට පැ.කි.මී. (50-70) දක්වා. |
| 16N-20N, 80E-92E | : උතුරු සිට ඊසාන දක්වා දිශාවලින් / පැ.කි.මී. (30-40); විටින් විට පැ.කි.මී. (50-60) දක්වා. |
| සෙසු මුහුදු ප්‍රදේශ | : ඊසාන දෙසින් හෝ නිශ්චිත දිශාවකින් තොරව / පැ.කි.මී. (20-40). |

**මුහුදේ ස්වභාවය:**

06N-16N, 80E-88E : ඉතා රළු; විටින් විට දළ රළු
00-06N, 80E-92E සහ 16N-20N, 80E-92E : තරමක් රළු සිට රළු; විටින් විට ඉතා රළු.
සෙසු මුහුදු ප්‍රදේශ : මඳ වශයෙන් රළු සිට තරමක් රළු දක්වා.

<u>අරාබි මුහුද</u>

**කාලගුණික තත්ත්වය:**

00-10N, 60E-80E : තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
10N-15N, 60E-75E : ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
සෙසු මුහුදු ප්‍රදේශ : ප්‍රධාන වශයෙන් වැසි රහිත.

**සුළං තත්ත්වය:**

00-05N, 60E-80E : බටහිර සිට නිරිත දක්වා දිශාවලින් / පැ.කි.මී. (25-35); විටින් විට පැ.කි.මී. (40-50) දක්වා.
07N-20N, 60E-75E : ඊසාන දෙසින් / පැ.කි.මී. (25-35).
සෙසු මුහුදු ප්‍රදේශ : වයඹ දෙසින් හෝ නිශ්චිත දිශාවකින් තොරව/ පැ.කි.මී. (10-20).

**මුහුදේ ස්වභාවය:**

00-05N, 60E-80E : මඳ වශයෙන් රළු සිට තරමක් රළු දක්වා.
සෙසු මුහුදු ප්‍රදේශ : සාමාන්‍ය ස්වභාවය සිට මඳ වශයෙන් රළු දක්වා.

<u>දකුණු ඉන්දියානු සාගරය</u>

**කාලගුණික තත්ත්වය:**

00-10S, 90E-100E : බොහෝ ස්ථානවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
00-05S, 60E-90E : තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
සෙසු මුහුදු ප්‍රදේශ : ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි.

**සුළං තත්ත්වය:**

00-10S, 70E-92E : දක්ෂිණාවර්තව භ්‍රමණය වේ / පැ.කි.මී. (20-40).
00-05S, 60E-70E : බටහිර සිට නිරිත දක්වා දිශාවලින් / පැ.කි.මී. (10-20).
සෙසු මුහුදු ප්‍රදේශ : ගිනිකොණ දෙසින් හෝ නිශ්චිත දිශාවකින් තොරව / පැ.කි.මී. (05-15).

**මුහුදේ ස්වභාවය:**

00-10S, 70E-92E : මඳ වශයෙන් රළු.
සෙසු මුහුදු ප්‍රදේශ : සාමාන්‍ය ස්වභාවය.

**ගිගුරුම් සහිත වැසි ඇති වන විට තද සුළං සමඟ එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක**.**

කාලගුණ විද්‍යාඥ
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව